

# පරිගණක යුගයේ නිමැවුම්කරුවා

**මවන්නටම හදපු මොළයක් –**

**නව සොයාගැනීම් කියන්නේ ඩැනී හිල්ස්ට සදාකාලික ආශ්වාදයක්. ඒ වගේම ඔහු ඒකට ගජ හපනෙක්.**

**ඔහු මුලින්ම පරිගණකයක් නිපදවූයේ ළමාවියේ දී ම ය. වයස අවු. 20 වන විට ඔහු සුපිරි පරිගණක නිපදවීම දක්වා වර්ධනය වුනා. දැන් "ඩැනී හිල්ස්" ඊටත් වඩා ලොකු හපන්කම් කරන්නයි සූදනම.**

නිර්මාණාත්මක හැකියාව උපතින්ම ගෙනෙන දෙයක් ද? නැත්නම් ඔවුන් එය ඉගෙන ගන්නවා ද? මතක ඇති කාලේ ඉඳන් මොළේ හිරි වැටෙනකම් නව නිර්මාණ කරන හැටි ගැන කල්පනා කරන්න පුරුදු වෙලා හිටිය ඩැනී හිල්ස් මේ ප්‍රශ්නය දිහා බලන්නේ අමුතුම ආකාරයකින්. (ඒක තමයි ඔහුට පුරුදු විදිය) ඔහු කියන්නේ "වැඩියෙන් වෙන්නේ නිර්මාණාත්මක හැකියාවන් මොට කර දැමීම" කියලයි. එක විදියකට බලපුවාම හැම දරුවෙකුටම තියෙන්නේ නිර්මාණාත්මක මනසක්. බොහෝ වැඩිහිටියන් කුඩා දරුවන්ගේ මේ නිර්මාණාත්මක මනස විනාශ කරල දමනව. විශේෂයෙන් ධෛර්යමත් නොකළොත්, අනුබල නොදුන්නොත් දරුවන්ගේ හැකියාවන් අනතුරට පත්වෙනවා. 'කුඩා දරුවන් නිරන්තරයෙන්ම අලුත් නිර්මාණ කරන්න සිත යොමු කරන්නට පුරුදුවෙලා ඉන්නවා. ඔවුන් පාසලට යනතුරා. එහිදී වැඩිහිටියෝ තේරුම් කරලා දෙනවා මේ වගේ මෝඩ වැඩ කරන්න කාලය නාස්ති කරන එක සුදුසු නැති බව." ඇප්ලයිඩ් මයින්ඩ්ස් ආයතනයේ හිල්ස්ගේ සහායකයා වන "බ්රුන් ෂෙරන්" කියනවා.

හිල්ස් ගේ "ඇපලයිඩ් මයින්ඩ්ස්" ආයතනය කියන්නේ "ජෙනරල් මෝටර්ස්" වැනි පළමු පන්තියේ ව්‍යාපාරික ආයතනවලටත්, ඇමරිකානු රජය වෙනුවෙනුත් පුදුම එලවනසුළු විද්‍යාත්මක නිර්මාණ බිහිකරන තැනක්.

හිල්ස්ගේ වාසනාවට (ඒ වගේම අපේත් වාසනාවට) ඔහු අදත් ලෝකය දකින්නේ හතරේ පන්තියේ හිටපු කාලේ ලෝකය දිහා බලපු නැවුම් ක්‍රීඩාශීලී මනසින්මයි. ඒ කාලේ තමයි ඔහු අහක දමන තීන්ත ටින්, මෝටර්, විදුලි බුබුළු භාවිතකරල රොබෝ කෙනෙක් හැදුවෙ. එකම වෙනස එද ඔහුගේ නිර්මාණ සෙල්ලමට වගේ කරපු ඒව. අද ඒවයින්

> **හිල්ස් ගේ "ඇප්ලයිඩ් මයින්ඩ්ස්" ආයතනය කියන්නේ "ජෙනරල් මෝටර්ස්" වැනි පළමු පන්තියේ ව්‍යාපාරික ආයතනවලටත්, ඇමරිකානු රජය වෙනුවෙනුත් පුදුම විද්‍යාත්මක නිර්මාණ කරන තැනක්. හිල්ස්ගේ වාසනාවට ඔහු අදත් ලෝකය දකින්නේ හතරේ පන්තියේ හිටපු කාලේ ලෝකය දිහා බලපු නැවුම් ක්‍රීඩාශීලී මනසින්මයි.**

අලුත්ම ව්‍යාපාර බිහිවෙනවා. සොල්දාදුවන්ට ජීවිත රැක ගන්න උදව් කරනවා. වෛද්‍යවරුන්ට අලුත් බෙහෙත් වර්ග ලබා දෙනවා. 'මයික්‍රොසොෆ්ට්' ආයතනයේ පර්යේෂණ අංශය භාරව සිටි 'නාදන් වේ වර්ල්ඩ්' කියනවා 'මිනිස්සු ඩැනී ගැන කථා කරනකොට නොවරදවාම කියන දෙයක් තමයි ඔහු පුංචි ළමයෙකුගෙ වගේ මනසක් තියෙන පුදුමාකාර මිනිසෙක් කියන එක. "දැන් වයස අවුරුදු 49 වන ඩැනී හිල්ස් පැහැදිලිවම වැඩිහිටියෙක්. ඔහු විධායක නිලධාරියෙක්. ඇමරිකානු රාජ්‍ය රහස් රකින ව්‍යාපාරිකයෙක්. තමන්ගේම පවුලක් නඩත්තු කරන කෙනෙක්. ඒත් ලෝකය දිහා මවිතයෙන් බලා සිටින පුංචි ළමයෙක් තවමත් ඔහු තුළ ජීවත් වෙනවා.


ඇමරිකාවේ 'කැලිෆ්වල' 'ග්ලේන්ඩේල්' කර්මාන්ත පුරයේ තියෙන 'ඇප්ලයිඩ් වයින්ඩ්ස්' ආයතනයේ දොරටුවෙන් ඇතු එවන කාටත් සුළු මොහොතකින් මේ කථාවේ ඇත්ත දැනෙන්න පටන් ගන්නවා. වැඩි විශේෂත්වයක් නැති පිළිගැනීමේ ශාලාවේ කෙළවර තිබෙන දොර ඇරගෙන ඇතුළු වෙනකොට හමුවෙන්නේ රතුපාට දුරකථන කුටියකින් පමණක් සමන්විත පුංචි කාමරයක්. හිල්ස් රිසීවරය අතට ගන්නවා.

"දම්පාටින් ලා සද බැස යනවා..." ඔහු දඟකාර සිනහවක් මුවග රඳවාගෙන දුරකථනයට මුමුණනවා. ප්‍රමෝධයෙන් බැබළෙන ඔහුගේ දැස් පසුපසට යොමුවෙනවා. ඔහු පසුපසින් තිබෙන බිත්තිය දෙපසට තල්ලුවෙමින් අරුමපුදුම ලෝකයක් අපේ දෙනෙත් හමුවේ දිග හැරෙනවා.

විශාල කාමරයක නොයෙකුත් විශ්මයජනක උපකරණ අතර යුහුසුළුව වැඩ කරන විද්‍යාඥයන්, අඩි 13 දිග රොබෝ ඩයිනෝසෝරයෙක්, රූපවාහිනී බාහිර පටිගත කිරීමකදී දකිනවාටත් වඩා සන්නිවේදන උපකරණ පටවාගත් කාන්තිමක් "වායුජායානයක්" ඔබ මේ අතර දකීවි. මේක එහෙම පිටින්ම අනාගත ආශ්චර්යයන් පිළිබඳ කෞතුකාගාරයක්.

ඔබ යන හැමතැනකම දකින්න ලැබෙන්නේ ඔබව මවිත කරන දේවල්. එක තැනක "ස්ටාර්වෝස්" චිත්‍රපටිය සිහිගන්වන පාලක මැදිරියක්. තව තැනක කඩිසර ගමනින් එහේ මෙහේ ඇවිදින රොබෝවරු. තවතැනක ඇමරිකානු රජය වෙනුවෙන් ක්‍රියාත්මක කෙරෙන රහසිගත පර්යේෂණයක්. තව කාමරයක් දිස්වන්නේ ඇල්බර්ට් අයින්ස්ටයින් ගේ නිවසේ කොටස් වගේ. බාගෙට ගලවපු වාහනවලට එක එක ජාතියෙ උපකරණ, ඇන්ටෙනා සවිකරලා මෙහෙම ඇවිදින කොට ඔබට හදිස්සියේ පැගෙන්න යන්නේ මොකක් ද? භීතියෙන් ලොමු දැහැගැන්වෙන, බිම දිගේ බඩගාගෙන යන අඩි 6 1/2ක් විතර දිග නයෙක්. බය වෙන්න එපා, ඌත් රොබෝ එකෙක්.

ඊළඟට ඔබ ඇතුළුවෙන්නේ ස්පර්ශයට සංවේදී දීප්තිමත් මතුපිටවල්වලින් යුත් මේස පිරුණ අඳුරු කාමරයකට. මෙහෙ ඇති හැම මේසයක්ම පරිගණක පුවරුවක්. චන්ද්‍රිකාවලින් ගත්ත ලෝකයේ විවිධ ප්‍රදේශවල ඡායාරූප ඒ මත විද්‍යමාන වෙනවා. ඔබේ ඇඟිලිවලින් ස්පර්ශ කිරීමෙන් ඔබට ලෝකයේ ඕනෑම ප්‍රදේශයක විස්තරාත්මක පිත්තුර ඉන් ලබා ගන්න පුළුවන්. ප්‍රදේශයක්, නගරයක් පමණක් නොවේ. වීදියක් උනත් හොඳින් අධ්‍යයනය කරන්න පුළුවන්. ඔබේ අත්ල රූපවාහිනී තිරය මත පිරිමැදීමෙන් ඔබට අතීතයට යන්නටත් පුළුවන්. උදහරණයක් වශයෙන් ඉරානයේ කාන්තාරයක ඉදි කරපු න්‍යෂ්ටික බලාගාරයක් හදපු හැටි පියවරෙන් පියවර පිත්තුර මඟින් බලා ගන්න පුළුවන්. ඊළඟ මේසයට ගියාම ලෝකෙ ඕනෑම තැනක භූ විද්‍යාත්මක විස්තර



රහස -

පොළොව මතුපිට භූ විෂමතා දැක්වීමට ඉහළට එසැවෙන දහස් ගණනක් අල්පෙනෙති වැනි කුඩා තුඩු.



සජීවී මේසය -

ලෝකයේ ඕනෑම පෙදෙසක, ඔබ මවිත කරවනසුලු ත්‍රිමාන රූප ලබා දෙන මේස මතුපිට

ලබා ගන්න එක හරිම ලේසියි. සිතියම ආකාරයෙන් මදිනම් අසල ඇති බොත්තම ඔබන්න. මොහොතකින් මේසයේ මතු පිටට පණ එන හැටි ඔබට පෙනේවි. ඔබේ දෑස් ඉදිරිපිට කඳු හෙල් ගංගා, මුහුදු මතුවෙන්න පටන් ගනීවි. තත්පර කිහිපයකින් ඔබට අවශ්‍ය ප්‍රදේශයේ ත්‍රිමාන ආකෘතියක් ඔබ ඉදිරිපිට. (පුදුමයි නේද?)

හිල්ස් ගේ විස්මයජනක ළමා උන්මාදය බෝවෙනසුළු එකක්. ඔහුගේ නිෂ්පාදනාගාරයට ඇතුළුවෙන ඕනෑම කෙනෙක් (ව්‍යාපාරික ලෝකයේ දැවැන්තයෙක් නැත්නම් පෙන්ටගනයේ ලොක්කෙක් උනත්) පොඩි ළමයෙක් වගේ ආස්වාදයෙන් ප්‍රබෝධමත් වෙන්න පටන් ගන්නවා. ඔබ එයට ඇතුළුවෙලා ටිකක් ඇවිදගෙන යනකොට "මේ ලෝකෙ කරන්න බැරි කිසිම දෙයක් නැහැ" කියලා ඔබට නොහිතුනොත් ඒක ලොකු පුදුමයක්.


වඩාත්ම සංකීර්ණ ඒ වගේම වැදගත් ප්‍රශ්නය තමයි මේ වගේ නිර්මාණකරුවෙක් නිර්මාණය කර ගත්තේ කොහොමද කියන එක. හිල්ස්ගේ නම ඇමරිකාවෙ ගෙයින් ගෙයට පැතිරුණු එකක් නොවෙයි. එහෙත් නිසැකයෙන්ම ඔහු ඉහළම පෙළේ විද්‍යාඥයන්ගේ, රජයේ බලවත්ම නිලධාරීන්ගේ, ඉහළ මට්ටමේ ව්‍යාපාරිකයන් ගේ නිරන්තර අවධානයට ලක්වෙලා හමාරයි. ඔහු පේටන්ට් බලපත්‍ර 70 කට අධික ප්‍රමාණයක හිමිකරුවෙක්. මේවා අතර පරිගණක තාක්ෂණයේ විප්ලවයක් කළ මතක ගබඩා කිරීමේ නවතම උපක්‍රමයක්, ඩිජිටල් කැමරාවක් වංචා සහගත ලෙස ලියවිලි සකස් කිරීම වළක්වන ක්‍රමයක් සහ තවත් නොයෙකුත් විස්මයජනක නිර්මාණ තිබෙනවා.

ඔහු පරිගණක විද්‍යාව, ගණිතය සහ නිර්මාණාත්මක කුසලතාව වෙනුවෙන් විශිෂ්ට සම්මාන දිනා ගත් අයෙක්. "මිනිස්සු පුද්ගලයන්ව අඩි තක්සේරුවකට ලක් කරනවා. ඔවුන් ම නිර්මාණය කරපු සමාජ ක්‍රමය ගැන කථා කරන්නේ අව තක්සේරුවෙන්." හිල්ස් එහෙම කථා කරන්නේ තමන්ගේ හැකියාවන් ගැන ඉතාමත් නිහතමානීව.

එහෙමනම් 'හිල්ස්' කියන්නේ සමාජ ක්‍රමය ඉතාමත් සාර්ථකව වැඩ කරපු අවස්ථාවක්. ඔහු විද්‍යාවේ දරුවෙක් පමණක් නොවෙයි. විද්‍යාඥයන්ගෙත් දරුවෙක්. ඔහුගේ පියා ගුවන් හමුදාවේ වසංගත රෝග පිළිබඳ විශේෂඥයෙක්. මව ජීව සංඛ්‍යාන නිලධාරිනියක්. ඔවුන් ජීවත් වුනේ බෝල්ටිමෝවල. ඒත් නිරන්තරයෙන්ම ඉන්දියාවේ නැත්නම් කොංගෝව වගේ තැන්වලට ඔවුන්ට යන්න සිදුවුණා.

කොහේ ගියත් හිල්ස්ගේ අත්හදාබැලීම් වැඩ නැවතුනේ නැහැ. ඔහු දේවල් හැදුවා. කැලි කැලිවලට වෙන් කළා. සමහර වෙලාවට පුපුරවා හැරියා. ඔහු මැසචුසෙට් තාක්ෂණ විද්‍යා අකඩමියේ දෙවැනි වසරේ ඉගෙනුම ලබන කාලෙදිම පරිගණකයක් නිර්මාණය කළා. හිල්ස් ආයතනයේ කෘත්‍රිම බුද්ධිය පිළිබඳ රසායනාගාරය තුළ තමයි වැඩියෙන්ම කාලය ගත කළේ. ඔහුට ඕනෑ උනා සිතන්න පුළුවන් යන්ත්‍රයක් හදන්න. "දැනට තියෙන පරිගණක කරන්නේ ගණනය කිරීම විතරයි" ඔහු වරක් ප්‍රකාශ කළා. "මට ඕනෑ වෙන්නේ නිර්මාණකරුවා ගැන ආඩම්බරයෙන් හිතන්න පුළුවන් පරිගණකයක් හදන්නයි."

මේ අරමුණ ඉටුකරගන්න ඔහු එක ප්‍රෝසෙසරයක් පමණක් අඩංගුවන, වර්තමාන පරිගණක නිර්මාණ ශිල්පය උඩු යටිකුරු කරන්න කල්පනා කරා. දහස් ගණනක් "ප්‍රෝසෙසර්" එකට වැඩ කරන සුපිරි පරිගණකයක් ගැන ඔහු සිහින මැව්වා. ඔහුගේ මෙම "සමාන්තර ක්‍රියාවලිය නමැති සිද්ධාන්තය ඔහුගේ ආචාර්ය උපාධි නිබන්ධනය සඳහා පදනම් උනා පමණක් නොවෙයි ඔහු විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් වශයෙන් ඉන්න කාලෙදිම ඒ මත ව්‍යාපාරික ආයතනයකුත් ආරම්භ කළා. ඔහු එය නම් කළේ "තින්කින් මැෂින්ස්, (සිතන්න පුළුවන් යන්ත්‍ර) යනුවෙන්. ඇමෙරිකාවෙ C.B.S. රූපවාහිනී ආයතනය හිමි කෝටිපති ව්‍යාපාරික විලියම් පාලේ ගේ ආයෝජනයෙන් ඇරඹි හිල්ස්ගේ ව්‍යාපාරය සාර්ථක උනා. ඔවුන් ප්‍රොසෙසර්ස් 65536 කින් යුත් ඩොලර් මිලියන 10 වටිනා දැවැන්ත පරිගණකයක් නිර්මාණය කළා. 'තින්කින් මැෂින්' ආයතනයේ නිෂ්පාදන වැඩියෙන්ම මිලදී ගන්නේ ඇමරිකානු ආරක්ෂක අමාත්‍යාංශයයි. ඒ නිසාම සීතල යුද්ධය අවසානයත් සමග ම ඔහුගේ ව්‍යාපාරය බිඳ වැටුනා. නමුත් ඔහු වෙනත් වෙනත් නිර්මාණ කරන්න පටන් ගත්තා. අවු. 10,000 යන තුරු නිවැරදිව වෙලාව තබන්න පුළුවන් උපකරණයක් නිෂ්පාදනය කිරීමේ කටයුත්ත මේ අතර මුල් තැනක් ගත්තා. මේ මඟින් ඔහු පර්යේෂකයන්ව වැඩි වැඩියෙන් අනාගතය ගැන හිතන්න පෙළඹෙව්වා.



බිරූන් පවර්-

"මොග්" ඇප්ලයිඩ් මයින්ඩ්ස් ආයතනයේ සම නිර්මාතෘ බිරූන් ෆෙරන්

1996 දී හිල්ස් ඩිස්නි සමාගමේ පර්යේෂණ අංශය වන 'ඉමැජිනියරින්ස්' ආයතනයට බැඳුණා. මෙහිදී ඔහුගේ එක ව්‍යාපෘතියක් උනේ ඩිස්නි මැජික්ලන්තයේ සංචාරකයන් අතර ගැවසෙන්න පුළුවන් යෝධ රොබෝ ඩයිනෝසෝරයෙක් නිපැදවීම. මේ ඩයිනෝසෝරයා කොයිතරම් සංවේදීද කිව්වොත් උගේ කකුලට බිත්තරයක් පැගෙන්න ගියොත් ඌ පරිස්සමින් කකුල උස්සලා වෙන තැනකින් තියනවා. බිත්තරයට අංශු මාත්‍රයකින්වත් හානියක් නොවන්න.

ඉමැජිනියරින් සමාගමේ ප්‍රධානියා වූ ෆෙරන්ට් සමඟ හිල්ස් හොඳටම යාළු වුනා. 2000 වසරෙදි අඹ යාළුවො දෙන්නා ඇප්ලයිඩ් මයින්ඩ්ස් ආයතනය ආරම්භ කළා. මේ ආයතනයේ අලුත්ම සංකල්පයක් තමයි තමන්ගේ ආයතනයේ ඉන්න විශේෂඥයින්ව ප්‍රධාන ගනුදෙනුකරුවන්ට කුලියට දෙන එක. මේ වෙනුවෙන් 'ඇප්ලයිඩ් මයින්ඩ්ස්' ට ගාස්තුවක් ලැබෙනව. ඊට අමතරව නිෂ්පාදනවල පේටන්ට් අයිතියක් ලැබෙනවා. එහි විධායක නිලධාරියෙක් වන 'රොඩ් මර්ෆ්' ගේ අදහසට අනුව ඔවුන්ට ලැබෙන ගාස්තුවලින් පමණක් වුනත් සමාගමට ලාබදායී ලෙස පවත්වාගෙන යන්න පුළුවන්. පේටන්ට් අයිතිය ආපුවහම ලාභය දෙගුණ තෙගුණ වෙනවා.


ඇප්ලයිඩ් වයින්ඩ්ස් සහ 'හර්මන් මිලර්' ආයතන අතර ඇති වුන හවුල මේකට හොඳ උදහරණයක්. මේ සන්ධානයෙන් වෙළෙඳ පොළට ආපු පළමුවැනි ඩෂ්පාදනය සලකා බලන්න.

මේක එම ආයතන දෙකේ අවුරුදු 2 ක යුග ජීවිතයෙන් බිහිවුන දරුවෙක්. හර්මන් මිලර් ආයතනයට අවශ්‍යය උනා 'ඇප්ලයිඩ් මයින්ඩ්ස්' එක්ක එකතුවෙලා තමන්ගේ තාක්ෂණික නිම්වළලු පුළුල් කර ගන්න. ඒ ගොල්ලන්ට විසඳ ගන්න සිදු උන එක ගැටළුවක් තමයි, කාර්යාලවල නිලධාරීන්ගේ කුටි තුළ ඉන්න අයගේ පෞද්ගලිකත්වය පිළිබඳ ප්‍රශ්නය. ඔවුන් කථාකරන සංවේදී දේවල් පිටස්තරයන් අතට පත්වීම කාටත් ගැටළුවක් වෙලා තිබුණා.



"මැක්සි මොග්" –

දුෂ්කර ප්‍රදේශවල පර්යේෂණ චාරිකා සඳහා භාවිත කරන සුපිරි තාක්ෂණික උපකරණ පටවාගත් රළු භාවිතයට සුදුසු වාහනයක්.



## හිල්ස් ගේ වික්‍රම -

**(ඒ) පේටන්ට් බලපත්‍ර 70 කට වඩා අයිතිය ඇති 'ඇප්ලයිඩ් මයින්ඩ්' සම නිර්මාතෘ ඩැනී හිල්ස් දශක ගණනාවක් තිස්සේ අදහන්න බැරි තරම් පුදුමාකාර නිර්මාණ කරමින් සිටින කෙනෙක්. මේවායින් 1 ක් අවු 10,000 නොනැවතී ක්‍රියාත්මක වේවි.**

**(බී) ලීයෙන් හැදූ පරිගණකය මැයවුසෙට් තාක්ෂණ විද්‍යා ඇකඩමියේ දෙවැනි වසර ඉගෙනුම ලබන කාලයේදීම හිල්ස් ලීකෑලි 10,000 කින් පරිගණකයක් හැදුවා. මෙය තවමත් අනගිභවනීය වාර්තාවක්.**

**(සී) සුපිරි පරිගණකය - සාමාන්‍ය පරිගණකයක තියෙන්නේ 'ප්‍රොසෙසර්' එකයි. 'ප්‍රොසෙසර්' 65,000 කින් ක්‍රියාත්මක වන ලොව ප්‍රථම සුපිරි පරිගණකය හිල්ස්ගේ නිපැයුමක්. එයට රහස් ඔත්තු සේවා ආයතන වලින් විශාල ඉල්ලුමක් ලැබුනා. නමුත් ඔහුගේ 'තින්කින් මයින්ඩ්ස්' ආයතනය බංකොලොත් උනා.**

**(ඩී) රොබෝ ඩයිනොසෝරයා**

**අඩි 13 ක් දිග "ලකී" නම් රොබෝ ඩයිනොසෝරයා හිල්ස් හැදුවෙ "ඩිස්නි" සමාගම වෙනුවෙන්. දැන් ඌ හොංකොං ඩිස්නිලන්තයේ නරඹන්නන් අතර සැරිසරනවා. ඌ කොයිතරම් සංවේදී ද කීවොත් ඌට බිත්තරයක් පෑගෙන්න ගියත් පරිස්සමෙන් කකුල අහකට ගන්නවා.**

**(ඊ) සනාතන හෝරා යන්ත්‍රය**

**ක්‍රිස්තු වර්ෂ 12,000 වන තුරු නොනැවතී දුවන්න සැලසුම් කළ ඔර්ලෝසුව (මතක් කරල එලාම් එක තියාගන්න.)**




**මගේ ප්‍රථම පරිගණකය-**

හිල්ස් (මැද) ඉන්දියානු විද්‍යා ප්‍රදර්ශනයකදී.




**ඩයිනෝ චීනයේ-**

**හොංකොං ඩිස්නිලන්තයේ සංචාරකයන් මැද නිදහසේ සැරිසරන යෝධයා "ලකී" කකුලක් පෑගුනොත් මොකක් වෙයිද? බයවෙන්න එපා ඌ හරිම සංවේදියි)**


සාමාන්‍ය කෙනෙකුගේ අතට මේ ප්‍රශ්නය පත් වුනානම් ඔහු මේක විසඳන්න හදන්නේ කුටිවල බිත්ති හරහා ශබ්දය ගමන් කිරීම වැලැක්වීමෙන්. 'හිල්ස්' මේ ප්‍රශ්නය දිහා බැලුවෙ වෙනස්ම විදිහකට. ඔහු අවන්හලක පරිසරය ගැන කල්පනා කළා. මිනිස්සු කැමතියි අවන්හල් තරමක් දුරට ඝෝෂාකාරී වනවාට. මිනිස්සුන්ගේ කටහඬ පසුබිමෙන් ඇහෙනවට. මොකද එතකොට තමන්ගේ සාමීචිය පිටස්තර අයට පැහැදිලිව ඇහෙන්නෙ නැහැ. එවිට තමන්ගේ සංවාදයට එක්තරා මට්ටමක පෞද්ගලිකත්වයක් ලැබෙනවා. හිල්ස් ගේ නිගමනය වුනේ මේකයි. සමහර වෙලාවට පසුබිමින් ඇහෙන හඬවල් අපේ සිත සතපවනවා. සමහර වෙලාවට කන්දෙස්කිරියාවක්. පසුබිමෙන් ඇහෙන හඬවල වචන පැහැදිලි නම් එය අපේ අවධානය බිඳ දමනවා. ශබ්දයේ අරුත තමයි කරදරයක් වන්නේ. කටහඬේ මාධුර්යය ඇත්තෙන්ම ප්‍රියජනකයි. මෙම සිද්ධාන්තය උපයෝගී කරගෙන හිල්ස් නිපදෙව්වා නවකථා පොතක් තරමේ පොඩි පෙට්ටියක් වගේ උපකරණයක්. මේක කාමරය ඇතුළෙ ඉන්න කෙනාගේ සංවාදයේම අපැහැදිලි අනුවාදයක් විකාශනය කරනවා. එතකොටම බිත්තියට එහා පැත්තේ ඉන්න කිසිම කෙනෙකුට ඇතුළේ කථාකරන දේවල් කොහොමවත් තේරුම් ගන්න පුළුවන් වෙන්නෙ නැහැ.

"ඔබේම කටහඬේ ශබ්දය තමයි ඔබ කියන දේවල පෞද්ගලිකත්වය ආරක්ෂාකරන්න තියෙන හොඳම ආවරණය" හිල්ස් කියනවා. "ඔබ කැලේක හැංගෙන්න උත්සාහ කරනවානම් ඔබේ සිරුර මත කැළේ අතු පැළඳගන්න එක තමයි හොඳම ක්‍රමය." මේ උපකරණය ඔවුන් නම් කළේ "බාබල්" කියලා. ඔබේ දුරකථනයට සම්බන්ධ කරන පුංචි කළුපාට පෙට්ටියක් සහ ඔබේ කුටියට උඩින් සවි කරන ස්පීකර් දෙකකින් මෙම උපකරණය සමන්විතයි. මෙය ක්‍රියාත්මක වන විට ඔබට අඩි 4 දුරින් ඉන්න අයෙකුටවත් ඔබ කියන දේවල්වල අරුත පැහැදිලි වන්නේ නැහැ. (ඇත්තටම කිසිම කෙනෙක් අඩි 4 කට වඩා ඈත් වෙන්න කැමති වුනේ නැහැ. එකෙන් ඇසුන ශබ්දය ඒ තරම් මිහිරියි.)

'හර්මන් මිලර්' ආයතනය මේ උපකරණය නිසා ප්‍රීතියෙන් පිනා ගියා. ඩොලර් 395 කට මිල කරන ලද මෙම උපකරණය විකුණන්නේ "සොනාරේ" නමින් අලුත් ආයතනයක් ඔවුන් ආරම්භ කරා.



සදාකාලික වෙලාව තබන්නා




මොළේ බලේ -
ඇප්ලයිඩ් මයින්ඩ්ස් තාක්ෂණ වනාන්තරයේ සැරිසරන ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු "අයිරා ලේමන්"

"අපි මේක විකුණන්නේ රෝහල්වලට, කාර්යාල සේවකයන්ට සහ ඕපාදූප ;සායත අසල් වැසියන් ඉන්න තට්ටු නිවැසියන්ට වගේ අයටයි. ඇත්තෙන්ම මිනිස්සුන්ට තමන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කරගන්න කොයි-තරම් උවමනාවක් තියෙනවද කියලා, දැනුයි අපට වැටහෙන්නේ."

අතිත් ව්‍යාපෘතිවල අරමුණු ඊටත් වඩා දැවැන්තයි. තවත් ප්‍රධාන ගනුදෙනුකාරයෙක් තමයි. "තෝතෝප් ග්‍රැමන්" කියන යුද උපක-රණ කොන්ත්‍රත් සමාගම. ඔවුන්ට විසඳන්ට ඕනෑ වුනා සොල්දාදුවන්ට කරගහගෙන යන්න තියන උපකරණවල බර පිළිබඳ ප්‍රශ්නය. වතුර, ආහාර, සන්නිවේදන උපකරණ සහ අවි ආයුධවල බර සොල්දාදුවෙකුට ඔරොත්තු නොදෙන තරම්. උත්තරය "ම්ටුවා". පොළවට අඩි කිහිපයක් උඩින් පාවෙන රොබෝ කෙනෙක්. ඔහු අර බර කරගහගෙන යනවා විතරක් නොවේ ඔහුට වාතයෙන් ජලය උක-හාගන්නත් පුළුවන්.

සොල්දාදුවන්ට "අපරිමිත දෘෂ්ටිය" ලබාදීමේ උපකරණයක් ලබාදීම තවත් ආරක්ෂණීය ව්‍යාපෘතියක්. මේකෙන් සොල්දාදුවන්ට තමන්ට ඉදිරියෙන් තියෙන බිත්තියකින් එහා-පැත්ත එහෙමත් නැත්නම් කන්දකින් එහා පැත්ත උනත් හොඳින් බලාගන්න පුළුවන් වෙනවා. "ග්‍රමන්" සමාගමේ උප සභාපති වන ජෙරාඩ් රොකනෝවො පවසන්නේ ඩැනි සහ බිරුත් අපේ රටේ ජාතික වස්තූන්. ඇත්තෙන්ම අපි දෙවියන්වහන්සේට ස්තුතිවන්ත වෙන්න ඕන ඔවුන් දෙන්නා බිත් ලාඩන්ගේ පැත්තට ලබා නොදීම ගැන."

ඇමෙරිකාවේ ලොකුම වාහන නිපදවන සමාගමක් වන ජෙනරල් මෝටර්ස් ආයත-නයත් ඇප්ලයිඩ් වයින්ඩ්ස් එක්ක හවුල් වෙලයි ඉන්නේ. ඔවුන්ගේ බලාපොරොත්තුවක් තියෙනවා දැනට රථයක තියෙන පැති කණ්-ණාඩි, පසුපස බලන කණ්ණාඩි, ඩෑෂ් බෝඩ් ලයිට් වෙනුවට රියදුරාට අංශක 360 හොඳින් පෙනෙන නවතම ක්‍රමයක් නිපදවන්න. නව අවුරුද්දක් යනකොට "ජෙනරල් මෝටර්ස්" සමාගම මේ සන්ධානයේ ප්‍රතිඵල තමන්ගේ නිෂ්පාදනවලට එකතු කරාවි.

හිල්ස් බලාපොරොත්තු වෙනවා ඔහුගේ තවත් ව්‍යාපෘතියකින් මිනිස් ජීවිත ලක්ෂ ගණනක් බේරාගන්න පුළුවන් සොයාගැනීමක් කරන්න. පිළිකා වගේ ආබාධවලට ප්‍රතිකාර කරන විට මතුවන ලොකු ගැටළුවක් තමයි සමහර බේත් වර්ගවලින් සුවය ලැබෙන්නේ රෝගීන් ඉතාම සුළු ප්‍රතිශතයකට පමණක් වීම. නමුත් කොයි රෝගියාට මේ බේත සුදුසුද කියල කලින් ලබාගන්න දැනට කිසිම ක්‍රමයක් නැහැ. හිල්ස් උත්සාහ කරන්නේ රෝගියකුගේ සිරුරේ තියෙන මිලියන ගණනක් වන ප්‍රෝටීන් වර්ග පිළිබඳ අධ්‍යනයක් කරන්න. ඒකෙන් පුළුවන් වෙනවා රෝගියාගේ සිරුරේ තියෙන පිළිකාවට සුදුසු කොයි බෙහෙතද කියලා නිගමනය කරන්න. සමහර අය කිය-නවා මේක කොහොමවත්ම කරන්න පුළුවන් දෙයක් නොවේ කියලා. හිල්ස් කියන්නේ "මේක හිතන තරම් අමාරු නැහැ." ඔහුට අනුව මේක වෛද්‍ය විද්‍යාත්මක ගැටළුවක් නොවේ, ඉංජි-නේරු විද්‍යාත්මක ගැටළුවක් යනුවෙන්.

"කළ නොහැකි දෙයක් ඇත්තේම නැත" මේ කියමන විශ්වාස කිරීම තමයි නිර්මාණක-රුවෙක් බිහිවීමේ ප්‍රධානතම සාධකය. "සාමාන්‍ය විද්‍යාඥයෙකුගේ තියෙන උදාසීන-භාවයට ප්‍රතිවිරුද්ධ හිල්ස්ගේ ධනාත්මක චින්තනය නිසායි. ඔහු මේ තරම් සාර්ථක නිමැවුම්කරුවෙක් බවට පත් වන්නෙ." හිල්ස් එක්ක 'තින්යන් මැෂින්ස්" ආයතනයේ සේවය සේවය කළ බෲස්ට කාලේ තියෙනවා. 'ඇප්ල-යිඩ් මයින්ඩ්ස්' ආයතනයේ හද ගැස්ම ඒකයි.

මෙම ආයතනයට අලුතින් සේවකයින් බැඳවා ගන්නකොට ඔවුන් විශේෂ පරීක්ෂණ-යකට භාජනය වෙනවා. මේක හඳුන්වන්නේ "පෙට්ටියේ සම්මුඛ පරීක්ෂණය" කියලා. හිල්ස් සහ පෙරත් අමුතු ජාතියේ අඩු බඩු-වලින් පුරවපු මෙවලම් මල්ලක් අපේක්ෂ-කයාට ලබා දෙනවා. ඔහු (පෙත් ඇය) එතැන්දි මේවා හඳුනාගත යුතුයි. එහෙම නැත්නම් මේවායින් කරන්න පුළුවන් මොනවාද කියල පැහැදිලි කළ යුතුයි. හිල්ස් කියනවා "අපි හරිම සතුටියි මේ අය ඉතාම නිර්මාණාත්මක වැරදි උත්තර දෙනවානම්."

හිල්ස් බඳවා ගන්නා බොහෝ දෙනා හිල්ස් වගේමයි. ඉතාම හොඳ අධ්‍යාපනයක් ලැබූ, පුංචි ළමයි වගේ හිතන මතන වැඩිහිටියන් "අපිට පුළුවන් වෙලා තියෙනවා සිහින" දකින්-නන් කණ්ඩායමක් හද ගන්න." හිල්ස් කියනවා. ඩැනී හිල්ස් කියන්නේ සොබාදහමේ නිර්මා-ණයක්ද නැත්නම් ඔහු ලැබූ අධ්‍යාපනයේ සහ පුහුණුවේ ප්‍රතිඵලයක්ද කියලා කියන්න අමා-රුයි. හැබැයි මේක තමයි ඔහුට උරුම තැන.

❑